සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි
## General Certificate of Education (Adv.Level), Grade 12, Year End Test, July 2019

**සිංහල - I**
**Sinhala - I**

71 S I

පැය 03 යි
**Three hours**

විභාග අංකය : ..........................................

සැලකිය යුතුයි :
- **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**
- පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් **හතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(01) (අ) ''හෙම්බල බමුණ, මා කෙරෙහි සිත් පහදවා එපමණකින් දෙව්ලොව උපන්නවුන් සියගණනිනුත් දහස්ගණනිනුත් ලක්ෂගණනිනුත් පුඩු කොට කියන්නට බැරි ය''යි කියාලා ඒ සාධන්ට නොවතත් ධම්පියාවෙන් ගාථාවක් කියම්. ගාථාව කියා අන්තයෙහි සුවාසුදහසක් දෙන කෙලෙස්සතුරන්ගෙන් කිසි කෙනෙකුන් මරා නිමවා කිසි කෙනකුන් එඩිදර්ප රහිත කොටලා නිවන්පුර වදිති. නිවන්පුර වැද පසු ව කලකදී කෙලෙස්සතුරන් මරා නිමවති. මට්ටකුණ්ඩලී නම් දෙව්පුත් ද කළා වූ **චිත්තප්‍රසාදයෙහි** විපාක දෙව්සැපක් ලත් පමණකින් කෙනෙක් බත් කැවත් පැන් පූවොත් මුත් පිපාසා සන්නොහිඳෙන්නා සේ නිවන් දුටුවොත් මුත් නොනිමන හෙයින් දහසක් නයින් සැදුම් ලද සෝවාන්පෙලෙහි පිහිටා ළස දිව්සැපත කර කොටගෙන අපායොත්පත්ති නැති කෙරෙති. ඉතා ලෙටි වූ අදින්නපුබ්බක බමුණු ද සෝවාන් ව ඇඹුලකින් තඹ මලකඩ නැතිවන්නා සේ ලෝහසිත් මඳ ව තමාගේ වස්තුව නිධානගතව තුබුවා තුබූ නියාව නොසේම හෙයින් උගුළුවා හැරගෙන කවර ලෙසිනුත් නොනස්නා ලෙසට අනුගාමික නිධාන කොට බුදුසසුන් නැමැති ක්ෂේම තැන ලයි.

(1) කෙලෙස්සතුරන්ගෙන් මිදෙන පිරිස කොපමණ ද?
(2) සෝවාන් ඵලයෙහි ස්වභාවය පිළිබඳ මෙහි දක්වා ඇති අදහස කුමක් ද?
(3) 'දෙව්ලොව උපන්නවුන් සිය ගණනිනුත්, දහස් ගණනිනුත්, ලක්ෂ ගණනිනුත් පුඩු කොට කියන්නට බැරිය' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(4) ''**චිත්තප්‍රසාද**'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04යි.)

(ආ) ඒ ගොයම් නිලන අවස්ථාවෙහි කුඹුර මැද රකවල් පැලක් තබාගෙණ මැසි දඬක් ලා ගෙන ගෙයි දී කන බතෙක රසක් නො දන ඇඳෙක පිටක් තබා රාත්‍රීන්දිවාභාගයෙහි එ මැසි දඬේ වැද හෙව රාත්‍රීන්දිවාභාගයෙහි එක දවසක ත් නින්දේ නින්දක් නිදා නො පියා ගෙරින් මීවුන් ඌරන් මුවන් ආදී වූ නානා සතුන් සාරමසක් රැසක් මැනැවි. කරලක් නැගුතෙන පටන්ගෙන පියන්වා ආදී වූ නොඑක් රෝගයට කෙම් පන්කම් සේ නැතිව කළ මැනැව. දවසින් දවසට කුඹුර සිසාරා අතු තබාලුව මැනැව. පන් ඇද්ද මැනැවි. මෙසේ දුක් ගෙන ගොයම් රකිනා කල සීනටි කුඹුරෙක් වී නම් තුන්සාරමසක් රක්ක මැනැව. මාවී කුඹුරෙක් ම නම් සමසක් සත්මසක් රක්ක මැනැව. මේ දැතුරෙහි ඇළ අමුණු පූවටා ආදී වූ බොහෝ කර්මාන්ත අත් **කමසේ නැතිව** කළ මැනැවි. පැසෙන මස මුළුල්ලෙහි බස බස රළ වන තුරු හඬග ගා කුඹුරෙහි ඒ මුල්ලෙන් ඒ මුල්ලට දිව දිව කම් සේ නැති ව කුරුලු කොබෝ ගිරා ආදී වූ වී කන සතුන් බිණුම් මැනැවි. ගොයම් පැසුණු කළ දා මැඩ අඳ වී නම් අඳයෙන් එකක් දුන මැනවි. තුනිනෙකක් වී නම් තුනිනෙකක් දුන මැනැව. බලාපු වී නම් හැම වී ම වී හිමියන්ට දුන මැනැව.

(1) සාරමසක් කුඹුර රැක්ක යුත්තේ එහි කුමන අවස්ථාවේ ද?
(2) කරල් හට ගත් දා සිට කළ යුතු දැ දෙයක් දක්වන්න.
(3) ''මේ දැතුරෙහි ඇළ අමුණු පූවටා'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(4) ''**කමසේ නැතිව**'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04යි.)

(ඈ) එකල්හි උතුම් ගුණ ඇති පතිවත්වූ ඇගේ සෝකාග්නි වේගය සුවාසුදහසක් යොදුන් උඩ නැඟී සක්දෙව් රජහුගේ භවනය හුණු කෙළේ ය. ශක්‍රදේවේන්‍ද්‍රයෝ දහසක් නුවණැසින් ලොව බලනුවෝ මේ කාරණය දැක බමුණුවෙසක් ගෙන ඇසිල්ලකින් අවුත් මහ බෝසතාණන් ඔත් ගල්මුදුනෙහි පෙණි කෙණ්ඩිකාවෙන් පැන් ගෙන මහබෝසතාණන් ඇඟ ඉසළුහ. එකෙණෙහි විෂ නැසී වනය සුවව කොතන විදිබවක් නොදත හැකිවිය. මහා බෝසත් එවිට අනුන්ට වෙහෙසෙන්නට මළ වෙස්ලා වැදහොත් එකෙකු පරිද්දෙන් වහා සුවපත් වූයේ ය. චන්ද්‍රිකාව ද එසඳ සුවපත්ව සිටි ප්‍රිය ස්වාමි දැක බලවත්වූ සොම්නසට පැමිණ ස්වාමීනී, යම්බඳු නුඹවහන්සේ මාගේ ප්‍රියකල්වූ ඇඟ අමාපැන් ඉස නිදුක් කොට මාගේ ඒ කළකම් දුරුකොට ප්‍රියවූ අප දෙදෙනා සමඟ කළ සේක්ද එසේ නුඹවහන්සේගේ ශ්‍රීපාදය වඳිම් වැදහොත්තීය. ඒ **ශක්‍රදේවේන්‍ද්‍රයෝ** ද උන් දැක බලවත්වූ සොම්නසට පැමිණ මෙතැන්හි නොවසව. පර්වතයෙන් බැස මිනිසුන්ට විසය තැන වෙසෙත්වයි අවවාදකොට තමන්ගේ දිව්‍ය ලෝකයට ගියාහ.

(1) සක්දෙව් රජුගේ භවනය හුණු වූයේ ඇයි?
(2) දෙව්රජ බෝසතාණන් සුවපත් කළේ කෙසේ ද?
(3) ''ඇගේ ශෝකාග්නි වේගය සුවාසුදහසක් යොදුන් උඩ නැඟී'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(4) ''**ශක්‍රදේවේන්‍ද්‍රයෝ**'' යන යෙදුමට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04යි.)

(ඇ) මෙසේ මල් පුදා ප්‍රාර්ථනා කළ ඉක්බිති ඒ කුමාරිකාවන්ගේ මෑණියෝ අවුත් තමන් දියණියන් මලස්න ශුධ නොකොට මල් පිදූ බව දැක ''එම්බල චණ්ඩාල කෙල්ල, අත්‍යන්ත නිර්මල වූ බුදුරජාණන් වහන්සේට මලස්න නොසෝධා කුමක් පිණිස මල් පිදී දැ තී කෙළේ කටයුත්තෙක් නොවේ''යි කීහ. ඒ අසා කුමාරිකාවෝ මෑණියන්ට කිපී ''චණ්ඩාලකෙලී නම් තෙපි ම යැ'' යි කියා තමන් මෑණියන්ට බිණුහ. මෙසේ ඒ කුමාරිකාවෝ මෙපමණ කුසල් අකුසල් කොට ම තිහාග යෙයි එයින් චුත ව දඹදිව උත්තර මධුරා නම් නුවර වීණා ගායනා කරන එක්තරා චණ්ඩාල බ්‍රාහ්මණයන්හට දූව උපන්හ. එකල්හි පළමු කළ ප්‍රාර්ථනා වූ පරිද්දෙන් විශිෂ්ට වූ රූ ඇති වූහ. ඔවුන්ගේ සියළඟින් විදුලිය කළඹක් වැනි රශ්මි මාලා සමූහයෝ නික්මෙති: හාත්පසින් සතර රියන් පමණ තන්හි ශරීරාලෝකයෙන්ම අන්ධකාර දුරු ව එකාලෝක වෙයි: ඔවුන් දෙතන මැද රන්වන් වූ තිලකාභරණයෙන් මැවිණ. ඒ තිලකාභරණයෙන් අභිනව **බාලාර්ක මණ්ඩලය** සේ රශ්මි සමූහයෝ නික්මෙති: ඒ කුමාරිකාවන් දුටු දුටු පුරුෂයෝ බොහෝ සේ උමතු වූවන් මෙන් කාමයෙන් මත් ව විසංඥ වෙති: අහෝ කුශලාකුශල කර්මයන්ගේ ආනුභාවය නම් ඉතා නොසිතිය හැක්කේ මැයි හේ එසේ මැයි.

(1) මෙහි දැක්වෙන දියණිය කළ නුසුදුසු ක්‍රියාව කුමක් ද?
(2) ඊ ළඟ භාවයේ ඇයට විශිෂ්ට රූපයක් ලැබුණේ කුමන හේතුවක් නිසා ද?
(3) ''අහෝ කුශලාකුශල කර්මයන්ගේ ආනුභාවය නම් ඉතා නොසිතිය හැක්කේ මැයි'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(4) ''**බාලාර්ක මණ්ඩලය**'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04යි.)

(ඉ) රන් රසු දැල් ගිගිළි
නන් දද පෙළින් වූ හෙළි
එනුවර තුර බැබළි
දුටහ කෙළිනා මහත් සැණකෙළි

සරා සලෙලු දන සතොසේ
සුරා පාන කරන ලෙසේ
පුරා අවුළු නොයෙක රසේ
සරා අවන්හල සහසේ

(1) ඒ නගරය ආලෝතවක් වීමට හේතු වූයේ කුමක් ද?
(2) අවන්හල කරා ඇදෙන්නේ කිනම් පුද්ගලයන් ද?
(3) පුරා අවුළු නොයෙක රසේ
සරා අවන්හල සහසේ
මෙමඋද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(4) ''**අවුළු**'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04යි.)

(ඊ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(1) ''මාගේ රථ මැදිරියෙක් ඇත. ඒ තෙමේත් ගනරන්මුවාය''
(2) ''තෙපි ගිහිගෙයි වසා නම් උපයා කන ලෙස් මා අතින් ඉගෙන ගනුව''
(3) ''මම කී පාද පරිචාරිකා කොට සොළොස් දහසක් පුරඟනන්ට අග මෙහෙසුන් කෙරෙමි''
(4) ''මා දුටුවා වූ යම්ම පුරුෂයෙක් කාමයෙන් මූර්ඡාව හෙයි''
(5) ''උඹේ මිනිහා කිව්වා හරි, මේ මාසෙ තමයි ළමයි මැරෙන්නෙ''
(6) ''පියරු දූම්මට මුහුණෙ ගඳ යනවද?''
(7) ''මිතුරන්ට ආපදා පැමිණි කල හිත මිතුරු උතුමෝම වෙත් පිහිට වන්නාහු''

(ලකුණු 3 × 4 = 12)

● **පහත දැක්වෙන කවි පෙළ පිළිබඳව රසාස්වාදයක් කරන්න.**

හිරුරැස් විඩාවෙන් පීඩිත කෙසෙල් වතු
සනසා පවන නළවයි දලු රිකිලි අතු
මළහිරු කිරණ සිප ගැවුණු පරිදි ලතු
රන්වන් වුණා පළුගස්වල මහලු පොතු

මැඩියෝ අඬති පෙරළූ නව කුඹුරු මඬින්
බස්සෝ ඉගිළ යති නිහඬව හිසට උඩින්
වවුලෝ පියාඹති මී ගෙඩි රැගෙන තුඩින්
ඈ කිසිවිටෙක තැති ගත්ත ද මෙවැනි හඬින්

සෙවණැලි නිදාගති ගම වට කළ බැද්දේ
උණ බට තරගයට මෙන් එකටෙක මැද්දේ
උකුළෙහි කළය ඉඟ අත තාලෙට පැද්දේ
ඇය එනු බලා වැඩි වෙයි රළවැල සද්දේ

මඟ අස මලාමැලි යුතු තැනිතලා වල
තණගොබ සමඟ පොරකයි නවතලා පැල
කේතකි පඳුරු අතරින් නැඟ සලා ගෙල
ඇය දෙස බලයි නිහඬව සුදු බලා වැළ

හැන්දෑ වලාකුළු නිල් නුබ ඔතා ගති
වැබඩ උණ පඳුරු ඇය ගැන කතා ඇති
රත්සර කැකුළු පෙඳ රැළි මැද ගොතා වෙති
පොබයයි ඇගේ වත නැරඹුම පතා පෙති

දෙසවන අදී වැව් පිටියේ නද සීරු
පෙඳ රැළි පෙනේ ලෙස නිල් වරලස පීරු
දේදුනු පෑ දියේ තව පීනති සේරු
පෑපත් රළ වළලු ඉන් වෙයි හුවමාරු

මංකඩ දිලේ විසිතුරු හිරු කිරණ වැනී
ඈ ඒ එළිය බී මගෙ හදවතට අනී
දියවැල් ඇගේ පය දූවටී වැලඳ ගනී
රන්වන් රිදී පෙති වතුරෙන් උඩට පනී

රෑ බෝ වීම මගෙ සතුටට හරස් වුණා
ඈ මා දැකීමෙන් මඳකට තිගැස්සුණා
අවිහිංසකව ඒ සමඟ ම හිනැස්සුණා
සතරැස පුදුම විදියට එක ඇසක් වුණා

(ලකුණු 12)

(02) ''ශ්‍රාවකයාට රසවත් කථාවක් සරල අයුරින් ඉදිරිපත් කිරීම සද්ධර්මරත්නාවලී කතුවරයාගේ අභිප්‍රායයි.'' නිර්දිෂ්ට කතාවක් ඇසුරෙන් නිදසුන් සහිතව විමසන්න.

**නැතහොත්,**

සදාචාරාත්මක ගුණයෙන් යුක්ත සමාජයකට මඟපෙන්වීම සඳහා අවශ්‍ය උපදෙස් ජාතක පොතෙන් ලබාගත හැක. චන්දකින්නර ජාතකය ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 15යි)

(03) කර්මය හා විපාකය කෙරෙහි නැඹුරුවෙමින් මිනිසුන්ගේ චර්යාවන් විවරණය කිරීමක් සද්ධර්මාලංකාරයෙහි දැකගත හැකිය. නියමිත කතාවක් මඟින් අදහස් දක්වන්න.

**නැතහොත්,**

සාමාන්‍ය ජනතාවගේ ජීවිත ක්‍රියාකාරකම් පිළිබඳව පුළුල් දැනුමක් පූජාවලිය කතුවරයා සතුවීදැයි නිර්දිෂ්ට කතාවක් ඇසුරෙන් විමසන්න. (ලකුණු 15යි)

(04) (අ) විවිධත්වයක් පිළිබිඹු කරන පද්‍ය සාහිත්‍ය කෘති මාලාවක් රචනා වීම නිසා කෝට්ටේ යුගය සාහිත්‍යමය අතින් ස්වර්ණමය යුගයක් විය. පහදන්න. (ලකුණු 07යි)

(ආ) ශබ්දය හා අර්ථය මැනවින් සුසංයෝග කිරීමෙන් ගුත්තිල කාව්‍යය රමණීය කාව්‍යයක් බවට පත් ව ඇති ආකාරය නිදසුන් දක්වමින් විමසන්න. (ලකුණු 08යි)

(05) පාරිසරික විපර්යාස හමුවේ අසංවේදී වන මිනිසුන්ගේ ජීවිත විවරණයක් බැද්දේගම නවකතාවෙන් නිරූපණය වේ. තහවුරු කරන්න. (ලකුණු 15යි)

(06) සර්වකාලීන ලෝක ධර්මතාවයන් මැනවින් නිරූපණය කෙරෙන කෙටිකතාවක් ලෙස ජී.බී. සේනානායකගේ වෙසක් පහන කෙටිකතාව අගය කළ හැකිය. පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

(07) තම අත්දැකීම ප්‍රබල ලෙස ඉදිරිපත් කිරීමට මුල් කාලීන කවීන් යොදාගත් භාෂා උපක්‍රම පිළිබඳ නියමිත පද්‍ය පන්ති දෙකක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 15යි)

(08) විශිෂ්ට බුද්ධිමතුන් පවා ප්‍රේමය හමුවේ සසලව අදූරදර්ශීව ක්‍රියා කරන අයුරු පෙමතො ජායතී සොකෝ නාට්‍යයෙහි උද්දාල බමුණාගේ චරිතයෙන් පෙන්වා දෙයි. මේ කරුණ සත්‍යදැයි පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Southern Provincial Department of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි
**General Certificate of Education (Adv.Level), Grade 12, Year End Test, July 2019**

**සිංහල - II**
**Sinhala - II**

| 71 | S | II |

පැය 03 යි
**Three hours**

විභාග අංකය : ......................................

**සැලකිය යුතුයි:**

**I** කොටසේ 1 ප්‍රශ්නය ද **II** කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
**I** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
**I** කොටස, **II** කොටසේ පිළිතුරුපත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

(01) එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 තාලුජ අක්ෂර පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) අ, ආ, ඉ, ඊ, උ, ඌ
(2) ක, ඛ, ග, ඝ, ඞ, ර
(3) ච, ඡ, ජ, ඣ, ඤ, ය
(4) ය, ර, ල, ව, ශ, ෂ
(5) ප, ඵ, බ, භ, ම, ණ (......................)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) නාම ලේඛනය, ඖදාර්ය, වර්දනය, විකාශන, ශිෂ්ටාචාරය
(2) නාම ලේඛනය, ඖදාර්ය, වර්ධනය, විකාශන, ශිෂ්ඨාචාරය
(3) නාම ලේඛණය, ඖධාර්ය, වර්ධනය, විකාශන, ශිෂ්ඨාචාරය
(4) නාම ලේඛණය, ඖධාර්ය, වර්දනය, විකාෂණ, ශිෂ්ටාචාරය
(5) නාම ලේඛනය, ඖදාර්ය, වර්ධනය, විකාශන, ශිෂ්ටාචාරය (......................)

1.3 අකාරාදී පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) නිබන්ධන, නිරාවරණ, නිර්දිෂ්ට, නිශ්චිත
(2) කනගාටු, කනිටු, කම්මැළි, කම්මුල
(3) උපිළිවෙළ, උපාධ්‍යාය, උණුසුම්, උත්සව
(4) ගණන, ගනඳුර, ගණිතය, ගනුදෙනු
(5) ආක්‍රමණ, ආකර්ෂණ, ආණ්ඩුව, ආදරණීය (......................)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ව්‍යඤ්ජන අක්ෂරයක් වෙනුවට ව්‍යඤ්ජන පිලි යෙදේ.

(2) ව්‍යඤ්ජන අක්ෂරවල හල් බව හැඟවීමට පිලි නොයෙදේ.

(3) ව්‍යඤ්ජන අක්ෂරවල ස්වරයක් නැති බව දැක්වීමට පිලි නොයෙදේ.

(4) ව්‍යඤ්ජන අක්ෂර අක්ෂරාණු ලෙස ද හැඳින්වේ.

(5) ව්‍යඤ්ජන අක්ෂර සඳහා ස්වර සහිතව පිලි යෙදිය හැකි ය. (......................)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) පාත්‍රා ධාතුව, විසෙස් සමාසය, ආශ්චර්යවත් සිද්ධිය, නාවික හමුදාව

(2) ද්වන්ද යුද්ධය, වනිතා කටයුතු, ගම්භීර විලාසය, ක්‍රීඩා කණ්ඩායම

(3) මාර්ග උපදේශක, ජීවිත ආශාව, විදෙස් ආධාර, විද්‍යා ආයතන

(4) අභිෂේක මංගල්‍යය, අමෘතභෝජන, දන්ත ධාතු, ගෘහ භාණ්ඩ

(5) දකාර්ථ සමාසය, උද්‍යාන බිම, මනුෂ්‍ය රූප, ස්කන්ධ කුමාර (......................)

1.6 තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ක්‍රීඩා, අමාත්‍ය, විද්‍යා, මඬල

(2) ප්‍රශ්න, නිරිඳු, යාත්‍රාව, මන්දිර

(3) දිව්‍ය, බස, වෘක්ෂ, නීති

(4) විශාරද, සූර්ය, ගන්ධ, බෝධි

(5) චක්‍ර, රුවන්, මධු, පුත්‍ර (......................)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) සුව, මඳ, නැණ, සැදැහැ

(2) සඳ, මඟ, සාගර, රළ

(3) ඇදුරු, රාජ, කරුණා, සෑය

(4) විහාර, අඳ, මැද, සිත

(5) ගඟ, බාල, ඇස, වජ්‍ර (......................)

1.8 කතු, කරණ, අවදි, සබඳ යන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) මැටිබඳුන්, මිහිදුම්, බඹදත්, දිවිහම්

(2) බඹදත්, දිවිහම්, මිහිදුම්, මැටිබඳුන්

(3) බඹදත්, දිවිහම්, මිහිදුම්, මැටි බඳුන්

(4) දිවිහම්, බඹදත්, මැටි බඳුන්, මිහිදුම්

(5) බඹදත්, දිවිහම්, මිහිදුම්, මැටි බඳුන් (......................)

1.9 කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) හඬන, කඩන, නටන, වැඩෙන

(2) දුටු, බටු, වටු, තටු

(3) ලියුම්, කියුම්, නැටුම්, ගැයුම්

(4) වන්දනීය, පූජනීය, ගෞරවනීය, ප්‍රාර්ථනීය

(5) බැඳි, රැකි, පිවිසි, මිරිකි (......................)

1.10 පහත සඳහන් උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියාවර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) ''ලකුණු **දුක** එන උවදුරු''

(ආ) ''**සදමින්** සිහසුන මුතු සේසත් යට''

(ඇ) ''**නොවව්** යන බස සැබෑ කෙළෙ මට''

(ඈ) ''මෙහෙවර කී **කරවයි** අගමැති හට''

(1) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(2) විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(3) විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

(4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

(5) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා (......................)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) රූපවත්, සැපවත්, ප්‍රීතිමත්, සිල්වත්

(2) බලතර, ගොරතර, ගරුතර, මහලුතර

(3) කථික, ධාර්මික, කාර්මික, වාර්ගික

(4) ව්‍යවහාර, බොරුකාර, කටකාර, ආඩම්බරකාර

(5) ගැමි, නැවි, කොටි, තොටි (......................)

1.12 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) විලාස, විමල, අනුරූප, විමුක්ත

(2) අලස, අදියර, අගමැති, අපවිත්‍ර

(3) ප්‍රබන්ධ, ප්‍රමාණ, ප්‍රසිද්ධ, ප්‍රයෝග

(4) අවගුණ, අවලකුණු, අවනීති, අවමඟ

(5) උපත, උගැනීම, උදම්, උගත් (......................)

1.13 නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ම, මිස, වින, මිසක්

(2) මොකද, පිණිස, අයුරු, තරම්

(3) අද, තවත, සමඟ, කැටුව

(4) වැලි, යළි, මෙන්, තෙක්

(5) තුරු, පටන්, වහා, ලෙස (......................)

1.14 ''**මහාධිකරණයේ දී නීතිඥයෝ** සාක්ෂිකරුවන්ගේ **නිර්දෝෂී** බව සනාථ කිරීම සඳහා සාක්ෂි විමසූහ.

යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන්නේ, කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සමාස, සන්ධි, තද්ධිත

(2) සමාස, තද්ධිත, සන්ධි

(3) සන්ධි, තද්ධිත, සමාස

(4) සන්ධි, සමාස, තද්ධිත

(5) තද්ධිත, සමාස, සන්ධි (......................)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) දිව්වේය, බැලුවෝය, පුදන්නේය, කෑවේය
(2) දිනේවා, කෙරේවා, කරනුව, දුවහු
(3) එළඹ, බැස, පායත්, ඇවිදින්
(4) දුවමින්, බලමින්, හැරදමා, නටමින
(5) මසත, දෙසද්දී, සිටැ, කරද්දි (......................)

1.16 සමාසයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) කුකවි, කුදිටු, කුමුදු, කුපුරිස්
(2) ගත්කරු, තිදොර, උණුදිය, මව්කිරි
(3) දුදන, ඉමහත්, නිදොස්, නොදියුණු
(4) ගල්හිත, නිල්මල, සිසිල්පැන්, අසරණ
(5) අතදර, සුසිරිත්, කහබත්, ගීනැටුම් (......................)

1.17 එකම වර්ගයට අයත් සන්ධිපද අන්තර්ගත වරණය තෝරන්න.

(1) සුරුවම්, සුවඳ, සුනුවම්, සුදුස්සෝ
(2) උකුස්සා, කුරුල්ලා, කෙල්ල, කොලුවා
(3) නුවණැත්තෝ, දණිස්, මනැසින්, යනෙන
(4) සත්නස්, සිත්තරුන්, අම්මල්, තම්පලා
(5) පූජෝත්සව, ජිනේන්ද්‍ර, පුනරුත්, රඹුක්කන (......................)

1.18 ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න.

(1) රැඟුම්, රැකීම්, කියුම්, බැලුම්
(2) කර, කරව, කරනු, කරන්න
(3) තෙර, හඬ, වස්, දොඩ
(4) වරලස්, සිසිලස්, මියුරැස්, මුහුලස්
(5) සුන්බත්, දුන්වත්, දෙව්දත්, දීබත් (......................)

1.19 ව්‍යාකරණානුකූලව නිවැරදි වැකිය තෝරන්න.

(1) මහා පරාක්‍රමබාහු රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයකු විය.
(2) අප විසින් දිනපතා පාසල් යා යුත්තෙමු.
(3) වෛද්‍යවරු සේවයෙන් බැහැර වී ඇත.
(4) සමහරු විනෝදය පිණිස බොරු කියති.
(5) මම ද අයියා ද සෙල්ලම් කරමි. (......................)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) අපි වතුර ටිකක් නාන්න ගියෙමු.
(2) ජපන්නු හපන්නුලු
(3) මොකද ළමයො මේ මහ රෑ අරුමැක්කේ?
(4) මේසේ උඩ තිබුණු බෑගය දුන් කෝ?
(5) ඔන්නිතිං ආයෙත් බොරු කියනවා. (......................)

(ලකුණු 20 යි)

## II කොටස

- මෙම කොටසින් (2), (3) ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

(02) (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වාග් විද්‍යාඥයා හා ව්‍යාකරණඥයාගේ විෂය ක්ෂේත්‍රය වූ භාෂාව පොදු විග්‍රහයකින් හඳුනාගනු ලැබුවේ ද ඔවුන් දෙදෙනා භාෂාව වශයෙන් හඳුනාගන්නේ ක්ෂේත්‍ර දෙකකි. මෙයින් සාම්ප්‍රදායික ව්‍යාකරණයට අනුව භාෂාව යනු හුදෙක් ලේඛනය වේ. එසේ නැතිනම් ග්‍රන්ථ ව්‍යවහාරයේ දී අනුගමනය කරනු ලබන සිද්ධාන්ත ක්‍රමය යි. වාග් විද්‍යාඥයාගේ කල්පනාවට අනුව මූලික වශයෙන් භාෂාව යනු භාෂණය හෙවත් කට වහරයි. ව්‍යාකරණඥයා භාෂාව වශයෙන් හඳුන්වනු ලබන ග්‍රන්ථ ව්‍යවහාරය භාෂණයේ ම දෙවැනි පිටපතක් ලෙස වාග් විද්‍යාඥයා නිගමනය කරයි. මේ අනුව භාෂාවේ හෙවත් කට වහරේ ඇති ශ්‍රවණ ගෝචර රටා (මුඛ කුහරයෙන් නිකුත් වන ශබ්ද) දෘෂ්ටි ගෝචර රටා බවට පරිවර්තනය කළ මාර්ගය ලේඛනය යි. (දිසානායක, භාෂාවක රටා සමුදාය, 119 පිට) එසේ හෙයින් වාග් විද්‍යාඥයා ගත් වහරට වඩා සැලකිල්ලට යොමු කරන්නේ කට වහරට හෙවත් භාෂණයට යි.

මිනිසා ප්‍රථමයෙන් ම ඇබ්බැහි වූයේත්, වන්නේත් කටවහර බසට මිස ග්‍රන්ථ ව්‍යවහාර භාෂාවට නො වේ. මානව ඉතිහාසය අධ්‍යයනය කරන්නෙකුට මේ බව වඩාත් හොඳින් අවබෝධ වේ. ලෝකයේ බොහෝ භාෂාවලට ලේඛන ක්‍රම ඇතත් කටවහර මෙන් නො ව ලේඛනය අමුතුවෙන් ම ආයාසයෙන් යුතුව පුහුණු කළ යුත්තකි. මෙය කවර භාෂාවකට වුව ද පොදු වූ ලක්ෂණයකි. එසේ ම ලේඛනයේ දී කටවහරේ ඇති ශ්‍රවණ ගෝචර රටා දෘෂ්ටි ගෝචර රටා හෙවත් සංකේත බවට පරිවර්තනය කරනු ලබයි. එහෙත් එය භාෂා ගණයෙහිලා එතරම් සැලකිය හැකි නො වේ. ඊට හේතුව වන්නේ ලේඛන ක්‍රම නැති නිසා භාෂා කොතොකුත් ලෝකයේ දක්නට ඇති නිසයි. නිදසුනක් ලෙස ලංකාවේ සීමිත ජන සංඛ්‍යාවක් භාවිත කරන භාෂාව වන්නේ ''වැදි භාෂාව යි'' එපමණක් නොව ඉන්දියාව, දකුණු ඇමරිකාව, අප්‍රිකාව වැනි රටවල පමණක් නො ව ඇතැම් ආසියාතික රටවල මෙබඳු ලේඛන ක්‍රම නැති භාෂා ඇතැයි පිළිගැනේ. එසේ වුවත් මේ හැම ජන කොටසක් ම අදහස් හුවමාරු කරගැනීම සඳහා විවිධ ක්‍රම අනුගමනය කරති.

(i) භාෂාව ක්ෂේත්‍ර දෙකකින් හඳුනාගන්නේ කවුරුන් ද?
(ii) සාම්ප්‍රදායික ව්‍යාකරණයට අනුව භාෂාව පිළිබඳ ව දක්වන විග්‍රහය කුමක් ද?
(iii) වාග් විද්‍යාඥයාගේ අවධානය යොමුවන්නේ කුමකට ද?
(iv) මිනිසා ප්‍රථමයෙන් කටවහරට ඇබ්බැහි වූ බව අනුමාන කරන්නේ කෙසේ ද?
(v) කටවහර ලේඛන ගතවීමේ දී සිදුවන්නේ කුමක් ද?
(vi) මෙහි දැක්වෙන පරිදි ''වැදි භාෂාව'' සැලකිය හැකි භාෂාවක් නොවන්නේ ඇයි? (ලකුණු 12යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග **වචන සංඛ්‍යාව** ද සඳහන් කරන්න.

ගෝලීය ධනවාදය මහා සංස්කෘතීන්ට මෙන්ම අවශේෂ සංස්කෘතීන්ට ද බලපාන ආකාරය ශ්‍රී ලාංකේය ආදිවාසී ප්‍රජාව ආශ්‍රයෙන් හඳුනාගත හැකිය. එම තත්ත්වය ප්‍රබලව හඳුනාගත හැක්කේ තිසාහාමිගේ පරපුර වන්නිලා ඇත්තන්ගේ පරපුරට වඩා ආදිවාසී අනන්‍යතාවක් සහිත තෙවැනි පරම්පරාවටයි. ආදිවාසී අනන්‍යතාවක් සහිත තෙවැනි පරම්පරාව බහුසංස්කෘතික අනන්‍යතාවක් සහිත පළමු දෙවැනි පරම්පරාවෙන් ඛණ්ඩනය කර හඳුනාගත හැකි ප්‍රජාවක් ලෙස මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

ගෝලීයකරණය, වෙළඳපොළ ආර්ථිකය රටක සුළු ජන කොටස්හි උරුම සංස්කෘතිය දියාරු වී යන ආකාරයත් මෙම අධ්‍යයනයෙන් හඳුනාගත හැකියි. මෙමගින් ආදිවාසී අනන්‍යතාව පවත්වාගෙන යාම ප්‍රබල අභියෝගයක් වී ඇත. විෂම සමාජ බලවේග හා අභියෝග හමුවේ ස්වකීය ගෝත්‍රික අනන්‍යතාව රැකගැනීමට වන්නිලැත්තෝ සවිඥානික වුවත් තෙවැනි පරම්පරාව වෙනස්වීම ලෝක යථාර්ථයක් ලෙස වටහාගනු ලබයි. සංවර්ධන ව්‍යාපෘති, දේශපාලන තීරණ, අධ්‍යාපනය, රැකියාවන් තෙවැනි පරම්පරාවේ අනන්‍යතාව දියාරුවීමට බලපෑ ප්‍රබල සාධකයෝ වෙති. භාෂාව, ඇඳුම් පැළඳුම්, විනෝදාංශ භාවිත කරන උපකරණ ආදියෙන් ආදිවාසී අනන්‍යතාව තෙවැනි පරම්පරාවට තවදුරටත් පවතී ද යන්න ගැටලුකාරී ප්‍රස්තුතයකි. වෙනස්වන ලෝකය සමඟ

වෙනස්කම අගය කරන තෙවැනි පරම්පරාව ඔවුන්ගේ නිජබිම් අවශ්‍ය යැයි තර්ක නොකරති. ඔවුන්ගේ එකම අපේක්ෂාව වෙනස්වන ලෝක යථාර්ථයට දැනුමෙන් මෙන් ම තාක්ෂණයෙන් ද සන්නද්ධ වීමයි.

විශේෂයෙන් තෙවැනි පරම්පරාවේ තරුණ ප්‍රජාවගේ භාෂාව, ඇඳුම් පැළඳුම්, විනෝදාංශ ගත්විට ද පෙනී යන්නේ මහා සංස්කෘතියේ හස්තයට හසුවී ඇති ආකාරයයි. එපමණක් ද නොව නූතන සන්නිවේදන උපක්‍රම භාවිතය, ප්‍රවාහනය මෙන්ම ආහාර පරිභෝජන රටාව ගත්විට ද පෙනී යන්නේ ඔවුන් ආදිවාසීන් අනන්‍යතාව පැවසූ විට පමණක් හඳුනාගත හැකි ප්‍රජාවක් ලෙසයි.

(ලකුණු 13)

(03) දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) වර්තමානයෙහි මතු වී ඇති ආගමික අන්තවාදය ශ්‍රී ලංකාවේ හෙට දවස අඳුරු කරයි ද?

(ii) කෘෂිකර්මාන්තයට මුල් තැන දෙන දේශීය ආර්ථික ප්‍රතිපත්තියක අවශ්‍යතාව,

(iii) විශිෂ්ට ගේය පද රචනා ජීවිතාවබෝධයට මඟ පාදයි.

(iv) සමාජ සංවේදී සිදුවීම් වාර්තා කිරීමෙහි ලා ජනමාධ්‍යයෙන් ඉටුවිය යුතු කාර්යභාරය

(v) සියලුම ජාතීන්ට එකඟ විය හැකි පොදු නීති පද්ධතියක් සැකසීම දේශපාලන තන්ත්‍රයේ ප්‍රමුඛ වගකීමකි.

(ලකුණු 25)

(04) (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන්** ඇතොත් නිදොස් කොට ලියන්න.

(1) මම ගමට එතියි අම්මා නොදනියි.

(2) දක්ෂ නිවේදකයකු වන්නේ කෙසේ ද?

(3) නව කර්මාන්තශාලාව සඳහා යන්ත්‍ර ක්‍රියාකරුවෙක් ඕනෑ කර තිබේ.

(4) හෙතෙම ගුරුවරයෙක් ද, සමාජ සේවකයකු ද වෙයි.

(5) සියලු මගීන් මේ නිවේදනය සවන් දෙත්වා!

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(1) ධර්මසේන හිමියෝ සද්ධර්මරත්නාවලිය රචනා කළහ.

(2) විදුහල්පතිතුමා ආරාධිත අමුත්තන් ගෞරවයෙන් පිළිගනියි.

(3) ගීත රචකයෝ නව සමාජ සංකල්ප බිහිකරති.

(4) පොලීසිය අන්තවාදීන් අත්අඩංගුවට ගනියි.

(5) දක්ෂ නිර්මාණකරුවෙක් අවුකන බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කළේය.

(ඇ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(1) සම්බුලා දේවී (තොමෝ/ තෙමේ) උයනට ගියා ය.

(2) (ඔවුහු/ ඔවුන්) අපට සත්‍ය පවසාවී.

(3) ගුරුවරු මේ ප්‍රතිඵලවලට (වගකිවයුත්තෝ/ වගකිවයුත්තන්) වෙති.

(4) (මා/ මම) තවමත් යාපනයට ගොස් නැත.

(5) මම ද මල්ලී ද හෙට ගමට (යමි/ යමු)

(ලකුණු 05 × 3 = 15යි.)

(05) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංකය දක්වන්න.

(i) **රටෙහි අධ්‍යාපනික** රටාව සියලු**ම** දරුවන්ට සමාන විය යුතුය.
(රටෙහි - විභක්ති, අධ්‍යාපනික - තද්ධිත, ම - නිපාත)

(ii) **නෙළුම්මලින් සැරසූ බුදුකුටියක්** පෙරහැරේ දක්නට ලැබුණි.
(නෙළුම්මලින් - සන්ධි, සැරසූ - කෘදන්ත, බුදුකුටියක් - තද්ධිත)

(iii) **ඉපැරණි රජදරුවෝ** ආදර්ශවත් පාලකයෝ **වූහ.**
(ඉපැරණි - උපසර්ග, රජදරුවෝ - සමාස, වූහ - ක්‍රියා)

(iv) **හිරුසඳු** එළිය **නො ලබන** තැනක් ලොවෙහි වේ ද?
(හිරුසඳු - සමාස, නො - නිපාත, ලබන - කෘදන්ත)

(v) **ප්‍රාදේශීය** සංවර්ධනය සඳහා **ගම්පෙරළිය** වැඩසටහන **මහෝපකාරී** වේ.
(ප්‍රාදේශීය - තද්ධිත, ගම්පෙරළිය - සමාස, මහෝපකාරී - සන්ධි) (ලකුණු 05 × 3 = 15යි.)

(06) (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත්ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් ලියන්න.
(ධර්මිෂ්ඨ, සොඳුරු, සංකීර්ණ, ඔසු, නීලවර්ණ, ගම්)

(1) ඔහු ............................................... ප්‍රශ්න රාශියකට මුහුණ දී සිටින බව දැනගන්නට හැකි විය.
(2) කාන්තාවකට හිමි පංචකල්‍යාණියෙහි ............................................... කේශ කලාපයට විශේෂත්වයක් හිමි වේ.
(3) ශ්‍රී ලංකාව තුළ ............................................... සමාජයක් ගොඩනැගීම සඳහා විවිධ රජවරු උත්සාහ කළහ.
(4) සතියේ සෑම දිනකම ............................................... හල විවෘතව පවතී.
(5) පහතරට ප්‍රදේශවල ශාන්තිකර්ම අතර ............................................... මඩු ශාන්තිකර්මය ජනප්‍රිය ව පවතී.
(6) දිවයිනේ සෑම ප්‍රදේශයකට ම ............................................... දසුන් දක්නට හැකිය.

(ලකුණු 1/2 × 6 = 03යි.)

(ආ) පහත දක්වා ඇති පද සන්ධිකර ලියන්න.

(1) විදුරු + අසුන
(2) මත් + ඇතෙක්
(3) දෙ + අගසව්
(4) දඩ + කම්
(5) කුමාර + උදය
(6) නි + ආකුල

(ලකුණු 1/2 × 6 = 03යි.)

(ඇ) තදකළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(1) වැද්දා **විසින් පොරවෙන්** ගස කපන ලදී.
(2) **අමාත්‍යතුමනි,** මේ මාර්ගය සාදා දෙන්නැ'යි **ගම්වැසියෝ** උද්ඝෝෂණය කළහ.
(3) **අපරාධකරුවාගේ** මළ සිරුර **ගල්වළෙහි** වැටී තිබුණි. (ලකුණු 1/2 × 6 = 03යි.)

(ඈ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත වාක්‍ය නැවත ලියන්න.

(1) සමාජයේ පවතින අපරාධ මිනීමැරුම් මත්ද්‍රව්‍ය පාලනයට දැඩි නීති සැකසිය යුතුය
(2) 12 13 ශ්‍රේණිවල සිසුන්ගේ මව පියා රැස්වීමට කැඳවන්නැයි විදුහල්පතිතුමා කීවේය
(3) ජනාධිපතිතුමා පාසලට පැමිණියේ ය එහි ඉදිකළ විද්‍යාගාරය විවෘත කළේය පාසැලේ දියුණුව දැක ඔහු අතිශයින් සතුටට පත්විය (ලකුණු 1/2 × 6 = 03යි.)

(ඉ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(1) ''දරුවනි, නුඹලා හොඳින් ඉගෙන ගන්නහු ද?''යි මව විමසීය.

(2) ''මම හොඳ ළමයෙක් වෙමි''යි සමන් කීවේ ය.

(3) ''අපි වෙසක් පෝය දා පන්සල් යමු'' යි මිතුරෝ කීහ.

(ලකුණු 1 × 3 = 03යි.)

(07) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දැනුම් ආර්ථිකයක සුවිශේෂී ලක්ෂණය වන්නේ අනෙකුත් ආර්ථික සම්පත්වලට වඩා දැනුම හැකියාව සහ ප්‍රවීණත්වය යන දැනුම් ඔස්සේ තීරණාත්මක වීමයි. දැනුම් ආර්ථිකයේ **ප්‍රාථමික** සම්පත දැනුම වන අතර භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන නිෂ්පාදනයේ සාම්ප්‍රදායික සාධක අතුරුදහන් නො වන නමුත් ඒවා ද්විතියික වේ. මෙහි දී දැනුම් ආර්ථිකයක් තුළ **ඵලදායිතාව** හා ආර්ථික සංවර්ධනය උදෙසා දැනුමේ සමාග්‍රහණය, නිර්මාණය, **ප්‍රචලිත වීම** හා ඵලදායී භාවිතය සිදු වේ. මෙහි සමාග්‍රහණය යන්නෙන් අදහස් වන්නේ ජාතික මෙන් ම අන්තර්ජාතික වශයෙන් නිර්මාණය කරනු ලබන දැනුම ග්‍රහණය කරගැනීමයි. නිර්මාණය යනු පර්යේෂණ මගින් රටේ සමාජ ආර්ථික අවශ්‍යතාවලට අදාළ නව දැනුම නිෂ්පාදනය කිරීම ය. ප්‍රචලිත කිරීම යනු දැනුම් සමාජයක් නිර්මාණය කිරීමේ සන්දර්භයක් තුළ සමාජය දැනුවත් කරනු පිණිස නො විධිමත් සහ අවිධිමත් අධ්‍යාපනය මාර්ගයෙන් එකී දැනුම සමාජය පුරා ව්‍යාප්ත කිරීම යි. මෙහි දී අධ්‍යාපනයේ සම අවස්ථා හා සාධාරණත්වයේ **මූලධර්මය** පදනම් කරගනිමින් සියලු ජනතා කොට්ඨාසවල සහභාගිත්වය ඇති ව දැනුම **ප්‍රජාතන්ත්‍රීකරණය** වේ. භාවිතය යන්නෙන් අදහස් වන්නේ භාණ්ඩ සහ සේවා නිපැයුම උදෙසා පවත්නා දැනුම ප්‍රයෝජනයට ගැනීමයි. එය ව්‍යවසායකත්වය, පුද්ගල අධ්‍යාපනය, **කුසලතා** මට්ටම් යන සියල්ලට ම අදාළ ය.

(1) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස් කර ලියන්න.

(2) දැනුම්, භූමිය, ප්‍රචලිත යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

(3) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

(i) මහප්‍රාණ අක්ෂරයක් සහ අන්තඃස්ථ අක්ෂරයක් එක ළඟ යෙදී ඇති වචනයක්

(ii) රකාරාංශය යෙදුණු තාලුජ අක්ෂරයක් සහිත වචනයක්

(iii) එකම අක්ෂරයේ අල්පප්‍රාණ අකුර සහ මහාප්‍රාණ අකුර එක ළඟ යෙදී ඇති වදනක්

(4) පහත සඳහන් ඡේදයේ පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.

නවෝත්පාදනය, පර්යේෂණ, සමාග්‍රහණය

(5) පහත දැක්වෙන කෘදන්ත ප්‍රභේදවලට අයත් වචනය බැගින් ඡේදයෙන් උපුටා ලියන්න.

භාවකාරක කෘදන්ත, වර්තමාන කර්තෘකාරක කෘදන්ත, කරණ කාරක කෘදන්ත

(ලකුණු 03 × 5 = 15යි.)

(8) පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(1) අසම්භාව්‍ය ක්‍රියා

(2) ගාත්‍රාක්ෂරලෝප සන්ධිය

(3) දකාරාර්ථ සමාසය

(4) ආධාර විභක්තිය

(5) අතිශයාර්ථ තද්ධිත ප්‍රත්‍යය (ලකුණු 03 × 5 = 15යි.)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved **Answer**

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Southern Provincial Department of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණ, 2019 ජූලි

**General Certificate of Education (Adv. Level), Grade 12, Third Term Test, July 2019**

සිංහල - I | 71 | S | I | **සිංහල - පිළිතුරු පත්‍රය**

## I පත්‍රය

(01) (අ) (1) සුවාසු දහසක්/ අසූහාරදහසක්/ 84000

(2) දහසක් නයින් සැදුම් ලද/ දහසක් න්‍යායන්ගෙන් යුක්ත

(3) දෙව්ලොව ඉපදුන අය සියගණනින්, දහස් ගණනින් හෝ ලක්‍ෂ ගණනින් ලසු කොට පැවසීම අපහසු ය.

(4) චිත්ත ප්‍රසාද යනු සිත් පහදවා ගැනීමයි.

(ලකුණු 04යි)

(ආ) (1) ගොයම් නිල් පැහැයෙන් වැඩෙන අවස්ථාවේ දී

(2) ගොයම්වලට සෑදෙන රෝග සඳහා කෙම් කිරීම කුඹුර වටේට අතු දැමීම.

(3) මේ දෙමැද්දේ කුඩා ජල මාර්ග හා කෙත්වලට ජලය ගෙන එන මාර්ග හරස් කර

(4) කටයුත්තේ නිමාවෙක් නැති ව (අවකාශයක් නැති ව) කම සේ - කර්මඡේද යන්නයි.

(ලකුණු 04යි)

(ඇ) (1) පතිවත්වූ කිඳුරියගේ ශෝකාග්නි වේගයට

(2) කෙණ්ඩියකින් පැන් ඉස

(3) ඇගේ ශෝකය නැමති ගින්න නැඟ ඒවා අසූ හාර ගණන් යොදුන් උඩ

(4) සක්දෙව්රජයි, දිව්‍යලෝක දෙකකට අධිපතියාය. ඇස් දහසක් ඇතැයි ද කියයි.

(ලකුණු 04යි)

(ඇ) (1) මල් ආසනය පිරිසිදු නොකර මල් පූජා කිරීම

(2) මල් පුදා කළ ප්‍රාර්ථනාව නිසා

(3) ''අහෝ! කුසල් හා අකුසල් යන කර්මවල බලසම්පන්න බව නම් සිතිය හැකි නොවේ.

(4) නොමේරූ සූර්ය මණ්ඩලයයි. ළහිරු මඬල යන්න ද නිවැරදි ය.

(ලකුණු 04යි)

(ඉ) (1) නන් දෑ පෙළින්/ නොයෙක් ධජවලින්/ රත්තරන්වලින්

(2) සරාගීකාමී පුරුෂයන්

(3) නොයක් රසයෙන් යුත් අවුළු පුරවා දහස් ගණන් අවන්හල් සරසා.

(4) අවුළු යනු ආහාර යන අර්ථයයි. මෙහි දී සුරා පානයට ලොල් වූ පුද්ගලයන් ගැන කියවෙන නිසා මෙයින් අදහස් කරන්නේ සුරාපානය සඳහා ගන්නා (''බයිට්ස්'') ආහාරයි.

(ලකුණු 04යි)

(ඊ) (1) සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලී කථා වස්තුවෙන් උපුටාගත් පාඨයකි. සොහොනේ දී අදින්නපුබ්බක බමුණා විසින් හැඬීමට කාරණා විමසූ අවස්ථාවේ දී දිව්‍ය පුත්‍රයා විසින් බමුණාට කරන ප්‍රකාශයකි.

(2) පූජාවලියෙහි අනුරුද්ධ කථාවස්තුවෙන් උපුටාගත් පාඨයකි. පැවිදිවීම පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේ දී මහානාම කුමාරයා විසින් අනුරුද්ධ කුමාරයාට කියන ලද ප්‍රකාශයකි.

(3) චන්දකින්නර ජාතක කථාවෙන් උපුටා ගත් පාඨයකි. කිඳුරාට වූ විපත නිසා මහ හඬින් කිඳුරිය වෙතට පැමිණෙන බ්‍රහ්මදත්ත රජු විසින් කිඳුරියට කරන ප්‍රකාශයකි.

(4) සද්ධර්මරත්නාවලියේ ස්වර්ණතිලකා කථා වස්තුවෙන් උපුටාගත් පාඨයකි. ස්වර්ණතිලකා පෙර භවයේ දී දාගැබට මල් පුදා කරන ලද ප්‍රාර්ථනාවේ සඳහන් ප්‍රකාශයකි.

(5) ජී.බී. සේනානායක මහතා විසින් රචිත වෙසක් පහන කෙටිකතාවෙන් උපුටා ගත් පාඨයකි. සවස්වරුවේ මුහුණ සෝදා පියරු තවරා වෙසක් කූඩු අලවමින් සිටින නංගි, කෝපගැන්වීම සඳහා අයියා/ කථකයා විසින් කරන ලද ප්‍රකාශයකි.

(6) පෙමතො ජායති සොකෝ නාට්‍යය දෙවන අංකයෙන් උපුටාගත් පාඨයකි. ආදරවන්තිය පිළිබඳ ප්‍රේම වියෝවෙන් පසුවන උද්දාල බමුණා විසින් කරන ප්‍රකාශයකි.

(ලකුණු 04 × 3 =12යි)

# II පත්‍රය

## I කොටස

| | | | |
|---|---|---|---|
| 01. (3) | 06. (4) | 11. (5) | 16. (1) |
| 02. (5) | 07. (1) | 12. (2) | 17. (3) |
| 03. (2) | 08. (3) | 13. (4) | 18. (5) |
| 04. (1) | 09. (2) | 14. (3) | 19. (4) |
| 05. (4) | 10. (5) | 15. (1) | 20. (2) |

(ලකුණු 20යි)

## II කොටස

(02) (අ) (1) වාග් විද්‍යාඥයා සහ ව්‍යාකරණඥයා
(2) ග්‍රන්ථ ව්‍යවහාරයේ දී අනුගමනය කරනු ලබන සිද්ධාන්ත ක්‍රමය
(3) කටවහරට/ භාෂණයට
(4) මානව ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන්
(5) ශ්‍රව්‍ය ගෝචර රටා දෘෂ්ටි ගෝචර රටා බවට පරිවර්තනය වීම.
(6) ලේඛන ක්‍රමවක් නැති නිසා
(ලකුණු 12යි)

(04) (අ) (1) මා
(2) නිවැරදි වාක්‍යයකි.
(3) යන්ත්‍ර ක්‍රියාකරුවෙකු
(4) සමාජ සේවකයෙක් ද
(5) සියලු මගීහු

(ආ) (1) ධර්මසේන හිමියන් විසින් සද්ධර්මරත්නාවලිය රචනා කෙරිණි/ කරන ලදී/ කරන ලද්දේය/ කරනු ලැබුවේය.
(2) විදුහල්පතිතුමා විසින් ආරාධිත අමුත්තෝ ගෞරවයෙන් පිළිගැනෙති/ පිළිගැනෙත්/ පිළිගනු ලබති/ පිළිගනු ලැබෙති
(3) ගීත රචකයන් විසින් නව සමාජ සංකල්ප බිහි කෙරේ/ බිහිකරනු ලබයි.
(4) පොලීසිය විසින් අන්තවාදීහු අත්අඩංගුවට ගැනෙති/ ගැනෙත්/ ගනු ලබති/ ගනු ලැබෙති.
(5) දක්ෂ නිර්මාණකරුවෙකු විසින් අවුකන බුද්ධ ප්‍රතිමාව නිර්මාණය කෙරිණි/ කරන ලදී/ කරන ලද්දේය/ කෙරුණේය.

(අ) (1) තෙමේ
(2) ඔවුන්
(3) වගකිවයුත්තෝ
(4) මා
(5) යමි. (ලකුණු 05 × 3 =15යි)

(05) (1) රටෙහි - විභක්ති > ආධාර විභක්ති /සත්තමී විභක්ති /අදර විබත්
අධ්‍යාපනික - තද්ධිත > ඊට අයත් යන අර්ථයේ ඉක ප්‍රත්‍යය
ම - නිපාත > අවධාරණාර්ථ නිපාත

(2) නෙළුම්මලින් - සන්ධි > ගාත්‍රාක්ෂර ලෝප සන්ධිය/ ගත්කුරුලොප් සඳ
සැරසූ - කෘදන්ත > අතීත කෘදන්ත
බුදු කුටියක් - තද්ධිත > අනියමාර්ථ අප්‍රාණවාදී උක්ත අක් ප්‍රත්‍යය

(3) ඉපැරණි - උපසරග > 'ඉ' අර්ථය වැඩිවීම.
රජදරුවෝ - සමාස > විශේෂණ සමාසය
වෙති - ක්‍රියා > ශුද්ධ ක්‍රියා

(4) හිරුසඳු - සමාස > දකාරාර්ථ සමාස/ ද අරුත් සමස්
නො - නිපාත > නිශේෂාර්ථ නිපාත/ නැත යන අර්ථයේ නිපාත
ලබන - කෘදන්ත > වර්තමාන කාල කෘදන්ත

(5) ප්‍රාදේශීය - තද්ධිත > ඊට අයත් යන අර්ථය
ගම්පෙරළිය - සමාස > විශේෂණ සමාස
මහෝපකාරී - සන්ධි > ස්වරාදේශ සන්ධි
(ලකුණු 15යි)

(06) (අ) (1) සංකීර්ණ
(2) නීලවර්ණ
(3) ධර්මිෂ්ඨ
(4) ඔසු
(5) ගම්
(6) සොඳුරු (ලකුණු 1/2 × 6 = 03යි)

(ආ) (1) විදුරසුන (2) මතැතෙක්
(3) දැගසව් (4) දඬයම්
(5) කුමාරෝදය (6) නිරාකුල

(ඇ) (1) කර්තෘ විභක්තිය - වැද්දා විසින්
කරණ විභක්තිය - පොරොවෙන්
(ලකුණු 1/2 × 6 = 03යි)

(2) ආලපන විභක්තිය - අමාත්‍යතුමනි
ප්‍රථමා විභක්තිය - ගම්වැසියෝ

(3) සම්බන්ධ විභක්තිය - අපරාධකරුවාගේ
ආධාර විභක්තිය - ගල්වළෙහි
(ලකුණු 1/2 × 6 = 03යි)

(ඇ) (1) සමාජයේ පවතින අපරාධ, මිනීමැරුම්, මත්ද්‍රව්‍ය පාලනයට දැඩි නීති සැකසිය යුතුය.

(2) 12 - 13 ශ්‍රේණිවල සිසුන්ගේ මව/පියා රැස්වීමට කැඳවන්නැයි විදුහල්පතිතුමා කීවේය.

(3) ජනාධිපතිතුමා පාසලට පැමිණියේ ය; එහි ඉදිකළ විද්‍යාගාරය විවෘත කළේ ය. පාසලේ දියුණුව දැක ඔහු අතිශයින් සතුටට පත්විය.

(ලකුණු 1/2 × 6 = 03යි)

(ඉ) (1) දරුවන් හොඳින් ඉගෙන ගනිත් වා දැයි මව විමසීය.

(2) තමා හොඳ ළමයෙක් වෙන බව සමන් කීවේ ය.

(3) තමන් වෙසක් පෝය දා පන්සල් යන බව මිතුරෝ කීහ.

(ලකුණු 1/2 × 6 = 03යි)

(07) (1) කුසලතා, ප්‍රචලිත, ප්‍රජාතන්ත්‍රීකරණය, ඵලදායිතාව, මූලධර්මය

(2) දැනුම - ඇදපිල්ල, කෙටිපාපිල්ල
හුමිය - දීර්ඝ පාපිල්ල, කෙටි ඉස්පිල්ල
ප්‍රචලිත - රකාරාංශය, කෙටි ඉස්පිල්ල

(3) (i) සන්දර්භයක්/ සාධාරණත්වයේ/ මූලධර්මය
(ii) ශ්‍රමය
(iii) කොට්ඨාසවල

(4) නව + උත්පාදනය = ස්වරාදේශ
පරි + ඊක්ෂණ = (අර්ධ) ස්වරාදේශ
සම + ආග්‍රහණය = පූර්වස්වර ලෝප/ දීර්ඝ

(5) දැනුම්, ලබන/ කරනු, ග්‍රහණය

(ලකුණු 3 × 5 = 15යි)


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON
DELIVERY
HOME
DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440